**<u>පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2026.05.13 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව.</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2026 මැයි මස 13 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

02. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති - එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.වී.නිර්මික දීපාල් අබේවර්ධන මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ජී.චන්ද්‍රලාල් මැතිතුමා.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ටී. ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය.
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එම්.ප්‍රදීපා ඉඳුමිණී කුලරත්න මැතිතුමිය.
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - වෙරංජා කාමනී විජේරත්න මැතිතුමිය.
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩබ්.මොහාන් මංජුල මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.තිෂෝක් මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ජෙගන් මෝහන් මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එච්.ඥානලතා හපුතන්ත්‍රී මැතිතුමිය
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩබ්.එම්. ශ්‍රියානි වීරසේකර මැතිතුමිය
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ධනේෂ් කුමරන් මැතිතුමා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඉන්දික කුමාර මැතිතුමා

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු විපක්ෂ නායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව,අපවත් වී වදාළ පාතකඩ දිද්දෙණිය විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේට ශෝකය පළ කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01.2026.04.07 මහා සභා වාර්තාව සභා සම්මත කිරීම.**

2026.04.07 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02. සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන**

පසුගිය අප්‍රේල් 10 වන දින ප්‍රාදේශීය සභාවේ කෙටි උත්සවයකදී සෞඛ්‍ය අංශය ඇගයීමක් කරන ලදි.අලුත් අවුරුද්දට සමගාමීව ඔවුන් හට වියළි ආහාර මල්ලක් ලබා දීමත්,ඔවුන් වෙත ත්‍යාග ප්‍රධානයක් සිදු කළ බව දන්වන අතර,සාකච්ඡා කළ පරිදි ආපදා කළමණාකරණ ඒකකය පිහිටුවීම සම්බන්ධයෙන් උපදේශක සභාවක් කැඳවා සාකච්ඡා කළ බවත්,ඒ සඳහා ආයතන කිහිපයක් සම්බන්ධ වූ බවත්,ඒ අනුව පළමු අදියරය ලෙස මේ සඳහා සේවක මණ්ඩලය බඳවා ගැනීම අවශ්‍ය බැවින් ගස් කැපීම්, අනෙකුත් පොදු කටයුතු සඳහා දක්ෂ ,ඔබ ප්‍රදේශයේ පදිංචි පුද්ගලයන් යොමු කරන ලෙසත්,එම පුද්ගලයන්ගෙන් සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමක් සිදු කරන බවත්ය. කඩිනමින් මේ සම්බන්ධයෙන් කටයුතු කරන ලෙසටද,මෙම කටයුතු සඳහා තෝරා ගන්නා පුද්ගලයන් හට අවස්ථාවට සුදුසු පරිදී ගෙවීමක් දීමනාවක් ලබා දෙන බවත්ය. පසුගිය අප්‍රේල් 12 වන දින හෝ 13 වන දින ආදාහනාගාර භූමියේ උතුරු පැත්තෙහි අනවසර ඉදිකිරීමක් සිදු කර ඇති හෙයින් සභාව මැදිහත් වී එම ඉදි කිරීම කඩා ඉවත් කළ බවත්, කේ.ඩී.යූ.සමූහ ව්‍යාපාරය මගින් ක්‍රීඩා පිටියක් සකස් කර ප්‍රාදේශීය සභාවට ලබා දීම සම්බන්ධයෙන් සාකච්ඡාවක පැවති බවත්,එහිදී දෙපාර්ශවය අතර ගිවිසුමක් නිර්මාණය වූ බැවින් ගිවිසුම

සම්බන්ධයෙන් සාකච්ඡා මට්ටමේ පවතින බවත්,මේ සඳහා භූමිය ලෙල්ලෝපිටිය විහාරස්ථානයෙන් ලබා දෙන බවත්,ඒ අනුව ක්‍රීඩා ගාරයක් අතුළුව ක්‍රීඩා පිට්ටනියක් නිර්මාණය කිරීමේ කාර්යය කේ.ඩී.යූ.සමූහ ව්‍යාපාරය මඟින් භාරගෙන ඇති බවත්,කේ .ඩී.යූ.සමූහ ව්‍යාපාරය මඟින් පවත්වන ලද ජොස්ඨ පුරවැසි බක්මහ උළෙල ප්‍රාදේශිය සභාවේ කාර්යය මණ්ඩලය විනිශ්චය කටයුතු සඳහා සම්බන්ධ වූ බවත්,යෝජනා ඉදිරිපත් කිරීමේදී ගරු මන්ත්‍රීන් විසින් ප්‍රාදේශිය සභාව මඟින් නීත්‍යානුකූල අනුකූල යෝජනා ඉදිරිපත් කරන ලෙසත්, සතිපොළ රථ ගාල භූමිය වාහන නැවත්වීමේ ස්ථානයක් ලෙස සංවර්ධනය කරන බවත් මෙම සංවර්ධනය සම්බන්ධයෙන් එකඟතාවයකට එළඹ ඇති බවත්,එම ස්ථානයේ ව්‍යාපාරික ස්ථානයක් ඉදි නොවන බවත්,නගරයේ පොදු වැසිකිළිය සංවර්ධනය කිරීම සඳහා මිලියන 11ක මුදලක් වෙන් වී ඇති බවත්,එම වැසිකිළියේ බාහිර හා අභ්‍යන්තර ස්වරූපය වෙනස් කර අලුතින් සැකසීමටත්,එහි මූලික සැලසුම සකස් කර ඇති බවත්,පාතකඩ ළිඳ සම්බන්ධයෙන් නැවත විමර්ශනයක් සිදු කරන බවත් ගරු සභාව ඉදිරියේ නිවේදනය කරන ලදි.

පෙ.ව.10.15 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඥානලතා හපුතන්ත්‍රී මැතිතුමිය,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා සභාවට පැමිණෙන ලදි.

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

වෛද්‍ය හේතුන් මත සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමියගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

වෛද්‍ය හේතුන් මත සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඉන්දික උදය කුමාර ගුණවර්ධන මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා සභාවට නොපැමිණි අතර,එතුමාගේ නිවාඩු අනුමත නොවිය.

**04.ගරු සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

2026 පැල්මඩුල්ල වෙසක් මහා මංගල්‍යය යන මැයෙන් ශ්‍රී රත්නාරාමය ,පහල බෝපිටිය විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් වෙසක් උත්සවයේ කටයුතු සඳහා දින 02ක කාලයක් සති පොළ රථගාල භූමිය වෙන් කර දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇති බව සභාව ඉදිරියේ ඉදිරිපත් කරන ලදි.

**05.යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න -නැත**

**06.යථා පරිදී කල් දී ඇති යෝජනා**

I. <u>**ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.**</u>

1.2025 භාණ්ඩ සමීක්ෂණය අනුව වෙන්දේසි කළ භාණ්ඩ අතුරින් වෙන්දේසි නොවූ භාණ්ඩ දෙවන වර වෙන්දේසි කිරීම සඳහා පහත සඳහන් කමිටුව පත් කිරීමට යෝජනා කරමි.

<u>තක්සේරු කමිටුව</u>

| | |
|---|---|
| ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| කේ.ඩබ්.එම්.එස්.ටී.එස්.ආනන්ද මයා | - යාන්ත්‍රික ඉංජිනියර් |
| එම්.ජී.එස්.මල්ලිකා මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරී |
| ජේ.එම්.එස්.කේ.බණ්ඩාර මයා | - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී |
| බී.එම්.අයි.එස්.යෝගරත්න මයා | - කාර්මික නිලධාරී |
| කේ.එම්.එන්.ගුණරත්න මිය | - ආදායම් පරීක්ෂක |

<u>වෙන්දේසි කමිටුව</u>

| | |
|---|---|
| ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| ආර්.ධනේෂ් කුමරන් මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| එම් .ජී.එස්.මල්ලිකා මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරී |
| එස්.රත්නාවතී මෙය | - සංවර්ධන නිලධාරී |
| කේ.ජේ.උපනන්ද මයා | - සංවර්ධන නිලධාරී |
| ඩබ්.එම්.ටී.හර්ෂණී මිය | - සංවර්ධන නිලධාරී |
| ඩබ්.ඩී.ආර්.විජේරත්න මිය | - සංවර්ධන නිලධාරී |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 01**

2025 භාණ්ඩ සමීක්ෂණය අනුව වෙන්දේසි කළ භාණ්ඩ අතුරින් වෙන්දේසි නොවූ භාණ්ඩ දෙවන වර වෙන්දේසි කිරීම සඳහා පහත සඳහන් කමිටුව පත් කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

තක්සේරු කමිටුව

| | |
|---|---|
| ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| කේ.ඩබ්.එම්.එස්.ටී.එස්.ආනන්ද මයා | - යාන්ත්‍රික ඉංජිනියර් |
| එම්.ජී.එස්.මල්ලිකා මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරී |
| ජේ.එම්.එස්.කේ.බණ්ඩාර මයා | - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී |
| බී.එම්.අයි.එස්.යෝගරත්න මයා | - කාර්මික නිලධාරී |
| කේ.එම්.එන්.ගුණරත්න මිය | - ආදායම් පරීක්ෂක |

වෙන්දේසි කමිටුව

| | |
|---|---|
| ඩබ්.ජී.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| ආර්.ධනේෂ් කුමරන් මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| එම් .ජී.එස්.මල්ලිකා මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරී |
| එස්.රත්නාවතී මෙය | - සංවර්ධන නිලධාරී |
| කේ.ජේ.උපනන්ද මයා | - සංවර්ධන නිලධාරී |
| ඩබ්.එම්.ටී.හර්ෂණී මිය | - සංවර්ධන නිලධාරී |
| ඩබ්.ඩී.ආර්.විජේරත්න මිය | - සංවර්ධන නිලධාරී |

02.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ට්‍රැක්ටර්, බැකෝ යන්ත්‍ර හා අනෙකුත් වාහන වල අලුත්වැඩියා කටයුතු සඳහා සහ ගස් කැපුම් සඳහා ප්‍රාදේශීය වශයෙන් ලියාපදිංචි වූ සේවා සැපයුම්කරුවන් ලැයිස්තුව අනුමැතිය සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 02.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ට්‍රැක්ටර්, බැකෝ යන්ත්‍ර හා අනෙකුත් වාහන වල අලුත්වැඩියා කටයුතු සඳහා සහ ගස් කැපුම් සඳහා ප්‍රාදේශීය වශයෙන් ලියාපදිංචි වූ සේවා සැපයුම්කරුවන් ලැයිස්තුව අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

03.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ගල්ලෙපිට ආදාහනාගාරයේ ආදාහනාගාර ගාස්තු ලෙස බල ප්‍රදේශය තුල රු.12,000.00 හා බල ප්‍රදේශයෙන් පිටත රු.15,000.00ක් වශයෙන් මුදල් අය කරන අතර,පවතින ගෑස් වල මිල වැඩිවීම හේතුවෙන් උක්ත මුදලට ආදාහන සිදු කිරීම ගැටළුකාරී තත්වයක් බැවින් එම ගාස්තු සංශෝධනය කිරීමට අවශ්‍ය හෙයින් මේ සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් කරුණු පැහැදිළි කිරීම සඳහා ගරු මහ සභාව කාරක සභාවක් බවට පත් කළ යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා ස්ථිර කරන ලදි.(පෙ.ව.10.30)

පෙ.ව.10.30ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා සභාවෙන් පිටවන ලදි.

දැනට ආදාහානාගාරය සඳහා ලිට්‍රෝ ගෑස් හා ලාෆ් ගෑස් භාවිතා කරන අතර,ලිට්‍රෝ 10ක් හා ලාෆ් 20ක් භාවිතා කරන බවත්, මේ වන විට ලිට්‍රෝ ගෑස් සඳහා රු.20,592.00ක්ද ලාෆ් ගෑස් සඳහා රු.20,592.00 වැඩි වී ඇත. ලිට්‍රෝ රු.3500.00කින් හා ලාෆ් රු.4000.00කින් වැඩි වී ඇති බවයි.මිනී එකක් පුච්චන විට යන ගෑස් ප්‍රමාණයට වඩා මිනී 02ක් පුච්චන විට යන ගෑස් ප්‍රමාණය වෙනසක් පවතී මන්ද 2ක් පුච්චන විට මැෂින් රත්වී ඇති නිසා ගෑස් අඩුවෙන් යන බවත්ය. ගෑස් මිල ,විදුලි බිල වැඩිවීමත් සමඟ මෙම වියදම දැරීමට නොහැකි බවත්,මේ හේතුව නිසා යම් ප්‍රමාණයකින් ගාස්තු වැඩිකරන ලෙසත්ය.මේ වන විට බොහෝ සභාවන් ආදාහනාගාර ගාස්තු වැඩි කර ඇති බවත්,බල ප්‍රදේශයේ වැඩි කිරීමට නොහැකි නම් බල ප්‍රදේශයෙන් පිට හෝ ගාස්තු වැඩි කරන ලෙස ප්‍රකාශ කරන ලදි.තවද බල ප්‍රදේශයෙන් පිටතින් එන ආදාහන ප්‍රමාණය අඩු බවත්,මේ අවස්ථාවේදී ගාස්තු වැඩි කිරීමක් සිදු කිරීම සුදුසු බවත්,ගෑස් මිලෙහි යම් අඩුවක් සිදු වුවහොත් මිලෙහි සංශෝධනයක් සිදු කළ හැකි බවත්.සභාවේ ආදායම් වියදම් තත්වයද සැළකිල්ලට ලක් කර සුදුසු තීරණයක් ලබා දෙන ලෙසට ප්රාදේශිය සභාවේ ලේකම් කපිල ජගත් ගුණතිලක මහතා පවසන ලදි.

මේ පිළිබඳ සාකච්ඡා විය

කාරක සභාව ගරු සභාව බවට පත් කළ යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා ස්ථිර කරන ලදි.පෙ.ව.10.40)

මරණයක් යනු සංවිධානය කරල වෙන දෙයක් නොවන බවත්,එම අවස්ථාවේදී මිනිසුන් අසරණ වෙන හෙයින් බල ප්‍රදේශයේ අයගෙන් දැන් පවතින අය කිරීම පවත්වාගෙන යනවානම් හොඳ බවත්,මේ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා පවසන ලදි.

මෙම යෝජනාව කාලෝචිත නමුත්,කෝටිපතියාට දුප්පතාට වුවත් දරාගත නොහැකි අවස්ථාවක් ලෙස මරණය හඳුන්වා දිය හැක.සභා බල ප්‍රදේශයේ පුද්ගලයන් යම් මුදලක් සභාවට ගෙවන බවත්,මේ වෙලාවේ ගාස්තු වැඩි කිරීමක් නොකරන ලෙසත්,ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික මැතිතුමාගේ පියාගේ අවමංගල්‍යය වෙනුවෙන් සභාව මැදිහත් වී කළ කාර්යයන් වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ කාර්යය මණ්ඩලයට හා ගරු මන්ත්‍රී මණ්ඩලයට ඉන්දික මැතිතුමා වෙනුවෙන් ස්තුතිය පුද කරන ලදි.

ආදාහනාගාරයේ මිල වැඩි කිරීම සම්බන්ධයෙන් බලවත් විරෝධය ප්‍රකාශ කරන බවත්,මන්ද ජනතාව මේ වෙලාවේ මිල වැඩි කිරීම් නොව සහන බලාපොරොත්තු වන බවත්,මේ වෙලාවේ එකින් එක වැඩි කළහොත් එච්චර හොඳ දෙයක් නොවන බවත්,අවස්ථාවක අඩු ආදායම්ලාභී පවුල් වල ආදාහන කටයුතු වලදී සහනයක් සළසා දෙන ලෙසටත් අප නොගන්නා ඉන්ධන දීමනා ,දුරකථන දීමනා එම කටයුත්තට යොදවන්න කියල යෝජනා කල බවත්,එම යෝජනාව සිදු කලේ මෙම වැඩි කිරීම්වලට විරුද්ධ නිසා බවත්,මේ අවස්ථාවේදී වැඩි කිරීම් නොකරන ලෙසත්,මේ සම්බන්ධයෙන් විරෝධය ප්‍රකාශ කරන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජ්.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි

මේ වෙලාව ලෝක තත්වය මත මැද පෙරදිග ඇති වී තත්වය මත භාණ්ඩ මිල ඉහළ ගොස් ඇති බවත්,මෙම අවස්ථාවේදී මේ තත්වය මත වැඩි කිරීමක් සිදු නොකළහොත් ගැටළුවක් වන බවත්,නමුත් අපි ජනතාව ගැනත් සිතිය යුතුය.ගැස් මිල වැඩිවීමට සාපේක්ෂ ගණනක් වැඩි කළහොත් හොඳයි යනුවෙන් අදහසක් ප්‍රකාශ කරන බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

පැල්මඩුල්ල බල ප්‍රදේශයේ ජනතතාවගෙනලෙබා ගන්නා ආදාහනාගාර ගාස්තු මෙම මොහොතේ වැඩි නොකරන ලෙසත්,බල ප්‍රදේශයෙන් පිටත වැඩි කර , බල ප්‍රදේශයේ ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවත්, බල ප්‍රදේශයෙන් පිටත රු.17,000.00ක මුදලක් ආදාහනාගාර ගාස්තු ලෙස අය කිරීම සුදුසු බවත් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසන ලදි.

බල ප්‍රදේශයෙන් පිටත රු.17,000.00ක මුදලක් ආදාහනාගාර ගාස්තු ලෙස අය කිරීම සුදුසු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ්.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා පවසන ලදි.

අප මහජනතාවට සේවය කල යුතු බවත්,සභාවක් ලෙස අපේ පිරිවැය ආවරණය කර ගත යුතුය.එසේ නොමැතිනම් පැවැත්මක් නොමැති බවත්,දෙයක් වෙනුවෙන් අපට වැඩිපුර වියදමක් දැරීමට සිදු වනවානම් ,ඒ වියදම ආවරණය වන්නේ නැත්නම් අපිට එය ඉදිරියට පවත්වාගෙන යා නොහැක.ටික කාලයක් කිරීමට හැකි බවත් අනාගතයේදී කඩා වැටීමකට ලක් විය හැක.ආදාහනාගාරය ලස්සනට පවත්වාගෙන යාමට,සේවකයින්ට අවශ්‍ය පහසුකම් සැපයීම වැනි දේවල් අඩු කිරීමට වෙනවා මේ පිරිවැය අවම කරගත්තේ නැත්තම්.පිටතින් ගන්නා රු.15,000.00ක මුදල රු.17,000.00ක මුදලකටත්,සභා බල ප්‍රදේශයේ රු.12,000.00 සම්බන්ධයෙන් පිරිවැය ගණනය කිරීමක් සිදු කර පිරිවැය ආවරණය වන මුදලක් දක්වා වැඩි කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා පවසන ලදි.

කිසිම වැඩි කිරීම් වලට හා සියලු යෝජනා වලට විරුද්ධ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 03</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ගල්ලෙපිට ආදාහනාගාරයේ ආදාහනාගාර ගාස්තු ලෙස බල ප්‍රදේශය තුල රු.12,000.00 හා බල ප්‍රදේශයෙන් පිටත රු.17,000.00ක් වශයෙන් මුදල් අය කිරීමටත්, ආදාහනාගාර ගාස්තු ලෙස බල ප්‍රදේශය තුල රු.12,000.00 ගාස්තු පිළිබඳ පිරිවැය ගණනය කර එම පිරිවැය ආවරණය වන මුදලක් ඉදිරියේදී තීරණය කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

04.2025 වර්ෂයේ ඉටුකරන ලද පහත කර්මාන්ත වල බිල්පත් වෙනුවෙන් ලද මුදල් ආවරණ අනුමැතිය යටතේ ගෙවන ලදි.පහත සඳහන් එම ගෙවීම් මහා සභා අනුමැතියට ඉදිරිපත් කරමි.

I. කිරිවැල්දෙණිය පන්සල අසළ සිට (250m) ඉන් ඉදිරියට ගල්අතුරා තාර දැමීම. - රු.1,265,454.15 -එක්සත් ත්‍රී රෝද රථ සංගමය,කිරිවැල්දෙණිය පන්සල හංදිය,සන්නස්ගම.
II. මොරතොට කොළණිය හංදියේ සිට චමින්ද මහතාගේ නිවස අසළ සිට සොහොන්පිටිය අසළ මාර්ගය ඉදි කිරීම. -රු.1,692,703.64 - ජය ශ්‍රී ප්‍රජා සහයෝගිතා පදනම ,නිමල් මාවත,මොරතොට,ඕපනායක
III. දොඹගස්වින්න සරෝදයට පිවිසෙන මාර්ගයේ සිට ඉදිරියට දොඹගස්වින්න පාසල අසළ මාර්ගය කොන්ක්‍රීට් කිරීම- රු.1,685,242.72 - යෞවන අවමංගල්‍යාධාර සමිතිය,දොඹගස්වින්න, ලෙල්ලෝපිටිය.
IV. ඉහළ බෝපිටිය පාලුවත්ත මාර්ගය ඉදිරියට පිළිසකර කිරීම - රු.1,378,002.21 -එක්සත් සුභ සාධක සමිතිය,ඉහළ බෝපිටිය,පැල්මඩුල්ල.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 04</u>**

ඉහත ගෙවීම් අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා විසින් කුට්ටපිටිය වසමේ නාරංගොඩ නො.06 පහළ මාර්ගයේ යන කොටසක මාර්ගයක් ගිලා බැසීම නිසා ගමන් කිරීමට නොහැකි තත්වයක් උදාවී ඇති බවත්,එය කඩිනමින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත.ඒ අනුව කාර්මික නිලධාරී විසින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර රු.27,279.29ක ඇස්තමේන්තුවක් සකස් කර ඇත.එම කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරීමට සභා අනුමැතියට කාරුණිකව ඉදිරිපත් කරමි

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම මාර්ගයේ ගිලා බැස ඇති සිදුර පමණක් සංවර්ධනය කර ජනතාවට ගමනාගමනය පහසු කිරීම සඳහා පමනක් මෙම යෝජනාව බාරගත් බවට ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

<u>**තීරණ අංක 05**</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා විසින් කුට්ටපිටිය වසමේ නාරංගොඩ නො.06පහළ මාර්ගයේ යන කොටසක මාර්ගයක් ගිලා බැසීම නිසා ගමන් කිරීමට නොහැකි තත්වයක් උදාවී ඇති බවත්,එය කඩිනමින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලීමට අනුව කාර්මික නිලධාරී විසින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර සකස් කරන ලද රු.27,279.29ක ඇස්තමේන්තුවට අනුව මෙම කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

06.පළාත් පාලන සේවා (පොදු පහසුකම්)සංරචනය යටතේ ගල්ලෙපිට ආදාහනාගාරයේ ගෑස් ගබඩා කර ඇති කාමරය පුළුල් කිරීමට යෝජනා වී ඇත.ඒ සඳහා සකස් කරන ලද රු.500,000.00 ඇස්තමේන්තුව සභා අනුමැතියට කාරුණිකව ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>**තීරණ අංක 06**</u>

පළාත් පාලන සේවා (පොදු පහසුකම්)සංරචනය යටතේ ගල්ලෙපිට ආදාහනාගාරයේ ගෑස් ගබඩා කර ඇති කාමරය පුළුල් කිරීම සඳහා සකස් කරන ලද රු.500,000.00 ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

07.2026 වර්ෂයේ පළාත් පාලන සේවා -ඝණ අපද්‍රව්‍යය කළමණාකරණ සංරචකය යටතේ කෙටේතැන්න ඝණ අපද්‍රව්‍යය කළමණාකරණ මධ්‍යස්ථානයේ කැඩීගිය වහළය සකස් කිරීමට රු.මිලියන 1.92 ප්‍රතිපාදන අනුමතව ඇත.ඒ සඳහා සකස් කළ ඇස්තමේන්තුව සභා අනුමැතියට කාරුණිකව ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>**තීරණ අංක 07**</u>

2026 වර්ෂයේ පළාත් පාලන සේවා - ඝණ අපද්‍රව්‍යය කළමණාකරණ සංරචකය යටතේ කෙටේතැන්න ඝණ අපද්‍රව්‍යය කළමණාකරණ මධ්‍යස්ථානයේ කැඩීගිය වහළය සකස් කිරීමට රු.මිලියන 1.92 ප්‍රතිපාදන අනුමතව ඇති හෙයින් ඒ සඳහා සකස් කළ ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමාගේ පුතා රෝහල ගත කොට ඇති බැවින් සභාවෙන් පිටවීමට පෙර එතුමාගේ යෝජනාව (න්‍යාය පත්‍රයෙහි යෝජනා අංක 22 ) ඉදිරිපත් කිරීම සඳහා ගරු සභාවෙන් ඉල්ලීමක් කල අතර සභාවේ පොදු එකඟතාවය මත එතුමාට තම යෝජනාව ඉදිරිපත් කිරීමට අවසර ලබා දෙන ලදි.)

22.වාහන අනතුරු වළක්වා ගැනීම සඳහා - ප්‍රධාන මාර්ගයේ දිනපතාම සිදුවන මාර්ග අනතුරු අවම කර ගැනීම සඳහා අවශ්‍යාම ස්ථාන වල CCTV කැමරා පද්ධතියක් සවි කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අවස්ථාව ලබා දිම ගැන ස්තුතිවන්ත වෙමින්, මෙම යෝජනාව ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ මාර්ගයේ සිදු වන වාහන අනතුරු අවම කර ගැනීමට විකල්ප ක්‍රමය කුමක්ද යන්න සාකච්ඡා වුණ බවත්,මොන දේ ක්‍රියාත්මක වුවත් වාහන අනතුරු විශාළ වශයෙන් සිදු වන බවත්,හැකියාවක් තිබේනම් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධාන මාර්ගයේ විශාළ වාහන ප්‍රමාණයක් ගමන් කරනවා.ඉතාමත් අපරික්ෂාකාරී රිය ධාවනය නිසා වටිනා ජීවිත ප්‍රමාණයක් අහිමි වෙනවා.ඒ වාගේම බල ප්‍රදේශයේ ජනතාවගේ සුරක්ෂිතතාවය පිළිබඳ විශාළ අවධානමක් පවතින බවත්,මෙම යෝජනාවෙන් බලාපොරොත්තු වන්නේ ව්‍යාපාරික ප්‍රජාවගෙන් හා අනිත් අයගේ සහයෝගය ලබා ගෙන රථවාහන පොලීසියේ උපදෙස් අරගෙන හා අනෙකුත් අයගේ අවවාද හා අනුශාසනා රැගෙන කැමරා පද්ධති සවි කර ඒවා තුළින් වැරදි රිය ධාවනයන් හඳුනාගෙන බලපෑමක් කළ හැකි බවත්,මේ පිළිබඳ රථ වාහන පොලිස් නිළදාරින්ගෙන් විමසීමක් සිදු කළ බවත් මෙය වටින යෝජනාවක් බවත් ප්‍රකාශ කල බවද,මාර්ගයේ අවශ්‍යා ස්ථාන වල කැමරා පද්ධතියක් සකස් කර වැරදි රිය ධාවනය සම්බන්ධයෙන් දඩයක් නියම කරන බවට සමාජගත කිරීමට හැකියාවක් පවතී නම්,ඉදිරියේදී මාර්ග නීති වලට අනුකූලව රිය ධාවනයක් සිදු වේයැයි විශ්වාසයක් පවතින බවත්,එහෙයින් සභාවේ මුදල් භාවිතා කර මෙම කාර්යය සිදු කිරීමට බලාපොරොත්තු නොවන බවත්,ව්‍යාපාරික ප්‍රජාවගේ සහය හා මේ සම්බන්ධයෙන් දැනුවත් අයගේ සහයෝගය ලබාගෙන මෙම කැමරා පද්ධතිය සකස් කිරීමට අවශ්‍යා කටයුතු සිදු කර වාහන අනතුරු වළක්වා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

සූර්යය පැනල් සවි කිරීමටත් ඒ ආධාරයෙන් විදුලි පහනක් හා කැමරා 02ක් සවි කිරීමට හැකියාවක් ඇති බවත්,එවිට විදුලිය සම්බන්ධ ප්‍රශ්නයක් පැන නොනගින බවත්,එම විදුලියෙන් කැමරා ක්‍රියා කිරීමට හැකි බවත්,එයට පොලීසිය සම්බන්ධකරගත් විට පොලීසියට පුළුවන් කැමරාවල තොරතුරු (දත්ත)ලබා ගන්න පුළුවන් එවිට මේ සියලු කටයුතු සාර්ථක කර ගත හැකි බවත්,මෙම කැමරාවක් සවි කිරීමට රු.50,000.00ක මුදලක් වැය විය හැකි බවත්ය.සියලු දෙනාගේ අදහස් අරගෙන මේ කාර්යය සාර්ථක කර ගත හැකිය මෙම යෝජනාව ප්‍රායෝගික මෙන්ම වටින යෝජනාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදි.

පෙ.ව.11.05 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා සභාවෙන් පිටවන ලදි.

**<u>තීරණ අංක 08</u>**

මෙම යෝජනාව කාලෝචිත බැවින් බල ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාව, පොලීසිය, මාර්ග සංවර්ධන අධිකාරිය ,මේ සම්බන්ධයෙන් දැනුමැති පුද්ගලයන් සම්බන්ධ කරගෙන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමාගේ මූලකත්වයෙන් සැලැස්මක් සකස් කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

08. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු ජේ.එන්.ජී.ලක්මිණ ,ආර්.උදයකුමාර, ඩබ්.සුමිත් යන සේවකයන්ගේ සේවා ගිවිසුම් කාලය මාස 03 කින් හා කේ.එච්.එල්.එස්.විමලරත්න, ටී.එම්.එස්.තෙන්නකෝන්,ටී.වී.පී.ලක්මාල් යන අයගේ සේවා ගිවිසුම් කාලය වසරකින් දීර්ඝ කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

සේවක ප්‍රශ්නය හරියට ක්‍රියාත්මක නොවන බවත්,කසළ කළමණාකරනයේදී වැඩි වශයෙන් සේවකයින් නොපැමිනිමක් පෙන්නුම් කරන බවත්,සමහර සේවක මහත්තුරු රාජකාරි කිරීම සම්බන්ධයෙන් ගැටළු කිහිපයක් පවතින බවත්, මෙම සේවකයින් මාසයක් දක්වා දීර්ග කිරීමටත්,මේ අයගේ ක්‍රියාකාරීක්වය පිළිබඳ පරීක්ෂණයක් කිරීමට කමිටුවක් පත් කිරීමත් එම කමිටුවෙන් මේ සම්බන්ධයෙන් නිර්දේශයක් ලබා ගැනිම සුදුසු බවත්,එම නිර්දේශයට අනුව ඉදිරි මහ සභාවේදී තීරණයක් ගැනීම සුදුසු බවට ගරු ප්රාදේශිය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

මෙම අනියම් සේවා කාණ්ඩය දීර්ඝ කිරීමේදී ඔවුන්ගේ සේවා ප්‍රගතිය සමාලෝචනය කළ යුතු බවත්,මහජන නියෝජිතයෝ ඒ පිළිබඳව සොයා බැලීමක් සිදු කල යුතුය.ජගත්,ආර්. උදයරාජ් සම්බන්ධයෙන් පැමිණීම ප්‍රමාණවත් නොවන බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

මෙම යෝජනාව කාලීන යෝජනාවක් නිසා ඉල්ලීමක් සිදු කරන බවත්, හොඳ දක්ෂ මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමෙක් සිටි බවත්,දැනට අයගම ප්‍රදේශයේ සේවය කරන බවත්,එතුමා මාරපන කොට්ඨාශයේ සේවය කළ බවත්,එතුමා ළඟ කසළ කළමනාකරණය පිලිබඳ විධිමත් සැලැස්මක් පවතින බවත්,එතුමා සම්බන්ධ කරගෙන වැඩසටහනක් සිදු කිරීම සුදුසු බවත්, මහජන සෞඛ්‍ය පරීක්ෂක පතිරණ මහතා සිටින කාලයේ කසළ කළමනාකරණය සම්බන්ධයෙන් ගැටළු පැන නොනැගුණු බවත්,එතුමා සම්බන්ධ කර ගැනීමට හැකිනම් කසළ කළමණාකරණය සාර්ථක වනු ඇති බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදි.

නැවත කමිටුවක් පත් නොකර මේ සඳහා පරිසර කමිටුවට මේ පිළිබඳ අවබෝධයක් තිබෙන නිසා පරිසර කමිටුවෙන් මේ පිළිබඳ සමාලෝචනය කිරීමටත්, අවශ්‍යය නම් කාර්යය මණ්ඩලයේ අධික්ෂණ නිළධාරීන්,විෂය භාර නිලධාරීන්,හා අවශ්‍ය නම් සේවකයින් කැඳවා පරිසර කමිටුව අවස්ථාවක් හෝ දෙකක් රැස්වී නිර්දේශ ලබා ගෙන ඉදිරි සභා වාරයට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 09</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු ජේ.එන්.ජී.ලක්මිණ ,ආර්.උදයකුමාර, ඩබ්.සුමිත් යන සේවකයන්ගේ සේවා ගිවිසුම් කාලය මසකින් දීර්ඝ කිරීමටත් සෞඛ්‍ය සේවකයින්ගේ සේවය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් අධික්ෂණයක් සිදු කිරීම සඳහා පරිසර හා පොදු පහසුකම් කමිටුව වෙත යොමු කිරීමටත් ලබන සභා වාරයට නිර්දේශ ඉදිරිපත් කිරීම සුදුසු බවත්, කේ.එච්.එල්.එස්.විමලරත්න, ටී.එම්.එස්.තෙන්නකෝන්,ටී.වී.පී.ලක්මාල් යන අයගේ සේවා ගිවිසුම් කාලය වසරකින් දීර්ඝ කිරීම සුදුසු බවත් ඒකමතිකව සභා සම්මත විය.

09.2025 භාණ්ඩ සමීක්ෂණයේදී නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ලේඛන ගත දෝෂ සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගී ඇති බැවින් එම ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් හා සභිකවරුන්ගෙන් දෙදෙනෙකු පත් කිරීමට යෝජනා කරමි.

| | |
|---|---|
| ජේ.එම්.එස්.කේ.බණ්ඩාර මයා | -ප්‍රධාන කළමනාකරණසේවා නිලධාරි |
| එස්.රත්නාවතී මැණිකේ මෙය | - සංවර්ධන නිලධාරි |
| පී.ඒ.සුධම්මිකා මිය | - සංවර්ධන නිලධාරි |
| එස්.ඩී.ජේ.එන්.ලක්මාලි මිය | - සංවර්ධන නිලධාරි |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

පෙ.ව.11.25ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.ශාන්ත පුෂ්පකුමාර කුඩාවත්ත මැතිතුමා සභාවෙන් පිටවන ලදි.

මෙම කමිටුවෙහි සභික වරුන් ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා සුදුසු බවට ගරු

ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා ස්ථිර කරන ලදි.

තවද ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී බී.තුෂාරි දමයන්ති මැතිතුමිය ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඥානලතා හපුතන්ත්‍රී මැතිතුමිය ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 10</u>**

2025 භාණ්ඩ සමීක්ෂණයේදී නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ලේඛන ගත දෝෂ සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගී ඇති බැවින් එම ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් හා සභිකවරුන්ගෙන් යුත් කමිටුවක් පත් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

| | |
|---|---|
| ගරු කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| ගරු බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා | - ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| ජේ.එම්.එස්.කේ.බණ්ඩාර මයා | -ප්‍රධාන කළමනාකරණසේවා නිලධාරී |
| එස්.රත්නාවතී මැණිකේ මෙය | - සංවර්ධන නිලධාරී |
| පී.ඒ.සුධම්මිකා මිය | - සංවර්ධන නිලධාරී |
| එස්.ඩී.ජේ.එන්.ලක්මාලි මිය | - සංවර්ධන නිලධාරී |

10. 2025.11.12 වන දින සභා තීරණ අංක 17 යටතේ ලබා ගත් පහත සඳහන් යෝජනාව සංශෝධනය කිරීම

සභා බල ප්‍රදේශය තුල ත්‍රී රෝද රථ නැවතීමේ ස්ථාන ලෙස නම් කර ඇති ස්ථාන 37කින් ගාස්තු අය කර ගැනිම පිණිස ලේඛනගතව ඇති ,එහෙත් නීත්‍යානුකූලව අය කර ගත නොහැකි රු.3,834,750.00ක ත්‍රී රෝද රථ ගාස්තුව ලේඛනවලින් කපා හැරීමටත් ලේඛනයේ බිල් කිරීම් නතර කිරීමත් සුදුසු බවට 2025.11.12 වන දින සභා තීරණ අංක 17 යටතේ සම්මත කරගත් යෝජනාවෙහි ත්‍රී රෝද රථ නැවතීමේ ස්ථාන ලෙස නම් කර ඇති ස්ථාන 37ක් ලෙස සඳහන් වී ඇති හෙයින් එය 39ක් ලෙස සංශෝධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඉහත යෝජනාව තුළ,ත්‍රී රෝද රථ නැවතීමේ ස්ථාන ලෙස ස්ථාන 39ක් සඳහන් විය යුතු බවත් එහි සඳහන් පරිදි රු.3,834,750.00ක මුදල රු.3,952,950.00 ලෙස වෙනස් විය යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

රු.3,834,750.00 ක මුදල රු.3,952,950.00 ලෙස වෙනස් වීම හේතු හා 2025 භාණ්ඩ සමීක්ෂණයේදී නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ලේඛන ගත දෝෂ සම්බන්ධයෙන් ගැටළු දැන ගැනීම සඳහා මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා ස්ථිර කරන ලදි.(පෙ.ව. 11.30)

මේ සම්බන්ධයෙන් විෂය නිලධාරීන් කැඳවා කරුණු විමසන ලදි.

පෙ.ව. 11.35 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.තිෂෝක් මැතිතුමා සභාවට පැමිණෙන ලදි

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා ස්ථිර කරන ලදි.(පෙ.ව. 11.40)

සභා බල ප්‍රදේශයේ ත්‍රී රෝද රථ නැවතීමේ ස්ථාන ලෙස අය කරන ගාස්තු කපා හැරීම සඳහා 2025.11.12 සභා තීරණය මෙසේ සංශෝධනය විය යුතුය.එනම් 2025 වර්ෂයේ 12.31 දිනට ත්‍රී රෝද රථ ගාල් 39ක් වෙනුවෙන් අය විය යුතුව තිබූ රු.3,952,950.00ක මුදල අප ආයතනයට අය කර ගත නොහැකි බැවින් එය කපා හැරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 11</u>**

සභා බල ප්‍රදේශය තුල ත්‍රී රෝද රථ නැවතීමේ ස්ථාන ලෙස නම් කර ඇති ස්ථාන 39කට අදාළ ත්‍රී රෝද රථ 788කින් ගාස්තු අය කර ගැනිම පිණිස ලේඛනගතව ඇති ,එහෙත් නීත්‍යානුකූලව අය කර ගත නොහැකි පහත සඳහන් වර්ෂ වලට අදාළ රු.3,952,950.00ක ත්‍රී රෝද රථ ගාස්තුව ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය මත ලේඛනවලින් කපා හැරීමටත්, බිල් කිරීම් නතර කිරීම , සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

- 2023 වර්ෂයට හිඟ මුදල - රු.1,212,900.00
- 2024 වර්ෂයට හිඟ මුදල - රු.1,326,600.00
- 2025 වර්ෂයට හිඟ මුදල - රු.1,413,450.00
- කපා හැරීමට ඇති මුදල - රු.3,952,950.00

11.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය ,විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා පළාත් සභාව මඟින් ගැසට් කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා මහා සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 12**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය ,විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ගැසට් කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

12. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ දැන්වීම් පුවරු වෙනත් තාවකාලික නිර්මාණ හා සැරසිලි කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වන අතුරු ව්‍යවස්ථාව පළාත් සභාව මගින් ගැසට් කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා මහා සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 13**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ දැන්වීම් පුවරු වෙනත් තාවකාලික නිර්මාණ හා සැරසිලි කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වන අතුරු ව්‍යවස්ථාව ගැසට් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

13.විද්‍යාල මාවත,පැල්මඩුල්ල ලිපිනයේ පවත්වාගෙන යනු ලබන පහත සඳහන් ස්ථානයන් සඳහා 2026 වර්ෂයට තක්සේරුව,රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් යොමු කර ඇත.

- ලොන්ඩරියක් පවත්වාගෙන යාම - බැවිලගේ ලාල් චන්ද්‍රසිරි මයා (2001 -2025) වසර 24 - වාර්ෂික බදු තක්සේරුව -රු.51,000.00
- වාහන ෂීට් කුෂන් කිරීම - එච්.වී.ප්‍රේමකුමාර මයා (2008-2025) වසර 17 - වාර්ෂික බිම් බදු තක්සේරුව - රු.17,000.00
- සී/ස සණස කලාප කාර්යාලය -(1993-2025) වසර 32- වාර්ෂික බදු තක්සේරුව -රු.28,000.00

2026 වර්ෂයට මුදල් ගෙවීමට එකඟ වූ බවත්,මීට පෙර වර්ෂ සඳහා කුලිය ගෙවීමට එකඟ නොවන බවත් දන්වා 2026.05.04 වන දින එච්.වී.ප්‍රේමකුමාර මයා සහ බැවිලගේ ලාල් චන්ද්‍රසිරි මයා ලිපි ඉදිරිපත් කර ඇත.මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සඳහා සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම ආයතන නීති විරෝධී ලෙස සිට ඇති බවත්,මේ මුදල ගැනිමට ආයතනික වශයෙන් නෛතිකව බැඳී සිටිනවාද යන්න පැහැදිලි කර ගත යුතු බවත්,එසේ හැකියාවක් ඇත්නම් එම මුදල අත හැරීමේ අයිතියක් සභාවට නොමැති බවත්,මෙම ගැටළුව නිසි පරිදී විසදා ගත යුතු බවත්,පළාත් පාලන කොමසාරිස් තුමාගෙන් නීතිමය තත්වය පිළිබඳ විමසීමක් සිදු කළ යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

එකපාර මෙම ව්‍යාපාර නතර කරන්නැතිව කරගෙන යාමට ඉඩ දීමටත්,බදු ලබා දිම සම්බන්ධව හා අය කිරීම් සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් තුමාගෙන් අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසන ලදි.

පෙ.ව.11.45 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. ධනේශ් කුමරන් මැතිතුමා සභාවෙන් පිටවන ලදි.

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා ස්ථිර කරන ලදි.(පෙ.ව. 11.45)

විෂය නිලධාරී කැඳවා මේ සම්බන්ධයෙන් ගැටළු නිරාකරණය කර ගන්නා ලදි.

පෙ.ව.11.55 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා සභාවෙන් පිටවන ලදි.

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා ස්ථිර කරන ලදි.(ප.ව. 12.05)

**තීරණ අංක 14**

නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව හරහා මෙම ව්‍යාපාරික ස්ථාන සම්බන්ධයෙන් විධිමත් අධීක්ෂණය වාර්තාවක් ලබන සභා වාරය වෙත ඉදිරිපත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

14.ආදාහනාගාර භූමියේ පරිසර අලංකරණය කර මහජනතාවට ප්‍රිය උපදවන ස්ථානයක් බවට පරිවර්තනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙය අත්‍යවශයම කාරණයක් බවත්,ආදාහනාගාර භූමියෙහි වටා බැම්මක් ඉදිකර පස් පුරවා සකස් කිරීමටත්,නිසි ආදාහන සැලැස්මක් සකස් කිරීමටත් සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 15</u>**

ආදාහනාගාර භූමියේ පරිසර අලංකරණය කර මහජනතාවට ප්‍රිය උපදවන ස්ථානයක් බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

15.විදුලි කාර්මිකයින් ,මාර්ග කම්කරුවන් ,සෞඛ්‍ය කම්කරුවන්,රියදුරන්,යන්ත්‍ර ක්‍රියාකරුවන් (JCB) අවශ්‍යතාවය මත සභාවේ සේවා කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා දෛනික කුලී පදනම මත බාහිර පුහුණු හා නුපුහුණු පුද්ගලයන් සේවයේ යොදවා ගැනීම සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඉදිරියේදි පිහිටුවීමට නියමිත හදිසි ආපදා කණ්ඩායම අරමුණු කරගෙන ප්‍රධාන වශයෙන් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්,හදිසි ආපදා කණ්ඩායම සඳහා ආයතන වලින් ගෙන්වූ අවස්ථාවේදී එම ආයතන උපකරණ ලබා දීමට සූදානම් බවත්,එම උපකරණ භාවිතා කිරීම සඳහා කාර්මිකයන් නොමැති වුවහොත් අප අපහසුතාවයකට ලක් විය හැකි බවත්,JCB යන්ත්‍ර පමණක් ලැබුණහොත් ඒ සඳහා ක්‍රියාකරුවන් අවශ්‍ය බැවින් මෙවැනි සේවාවන් පිටතින් සපයා ගැනීමට සිදුවෙන බවත්,ආපදා කළමණාකරණ ඒකකය සඳහා උපකාරයක් පිණිස හා මහජන නියෝජිතයින්ගෙන් විදුලි අවශ්‍යතා ඉටු කළ යුතු බවත්,අප ආයතනයේ විදුලි කාර්මිකයින් දෙදෙනෙකු ,රියදුරෙක්,වැඩ අධීක්ෂණ නිලධාරියෙකු සිටින බවත්,සමහර අවස්ථා වලදී අත් උදව්කරුවෙකු යොමු කරන බවත්,මෙම කාර්යය සඳහා 06 දෙනෙකු සම්බන්ධ වන බවත්,මේ වන විට විදු ලි බල්බ 600ක් පමණ සවි කර ඇති බවත්,මේ අනුව දවසකට ලයිට් 03ක් පමණ සවි වී ඇති බවත්,සේවා සංචිතය හා ප්‍රතිඵලය අතර නොගැළපීමක් පෙන්නුම් කරන බවත්,ප්‍රවාහන කුලියක් වැය වන බවත්(පෙට්‍රල්) උපයෝගිතාව කාර්යක්ෂමද කියල ප්‍රශ්නයක් පැන නගින බවත්,විශේෂයෙන්ම විදුලි අවශ්‍යතා සම්බන්ධයෙන් මහජන නියෝජිතයින්ගෙන් බලවත් ඉල්ලීම් පවතින බවත්,මෙම කටයුත්තෙහි අකාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරන බැවින්,මා සභාපති ලෙස සේම සෑම ප්‍රදේශයකින්ම නියෝජනය කරන මහජන නියෝජිතයන් ලෙස මෙම වැඩ කටයුතු නිසි ආකාරයෙන් කරනවාද යන්න සොයා බැලීමට වගකීමක් පවතින හෙයින් යෝජනාවක් ලෙස ගබඩාවෙන් නිකුත් වී ඇති විදුලි පහන් ප්‍රමාණයම සවි කර ඇත්ද?සවි කිරීම් පිළිබඳ දත්ත මෙම කණ්ඩායම තුල තිබෙනවාද?සවි කිරීමේ ප්‍රමාණය,සවි කිරීම් වේගය පිළිබඳ සොයා බැලීමක් සිදු කළ යුතු බැවින් කිසියම් කමිටුවක් පත් කර මේ කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කර ක්‍රියාත්මක කළ යුතු බව ගරු ප්‍රාදේශිය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

ආපදා සම්බන්ධයෙන් කතා කළ හෙයින් පැල්මඩුල්ල රත්නපුර ප්‍රදේශයට සෑම වර්ෂයකම දින 45 ගංවතුර තත්වයක් එන බවත්,මේ දින වල පවතින වර්ෂාවත් සමඟ ගංවතුර තත්වයකට පෙර සූදානම් විය යුතු බවත්,ප්‍රාදේශිය සභාවට ගස් කැපුම් යන්ත්‍රයක් ලබා ගැනීමට පසුගිය සභා වාරවකදී යෝජනා කර ඇති බවත්,මේ වැසි දවස් වල මෙය අත්‍යවශ්‍ය යෝජනාවක් බවත්,විදුලි සවි කිරීම් අඩු වීමක් නම් තිබෙන්නේ නම් එය ගැටළුකාරී බවත්,එම සවි කිරීම් ප්‍රමාණය වැඩි කිරීමට අවශ්‍යය වටපිටාවක් අපි සකස් කර දිය යුතු බවත්,ඔවුන්ට අවශ්‍ය වාහන විදුලි පහන් සවි කිරීමට අවශ්‍ය භාණ්ඩ ලබා දිය යුතුය.නියම කාර්යක්ෂම සේවාවක් කරා යාමට විදුලි කාර්මිකයින්ට 8.30 වටත් සභාවෙන් පිටවීමට අවශ්‍ය කටයුතු සළසා දිය යුතුය.විදුලි පහන් නව සවි කිරීම් වලට අමතරව අලුත්වැඩියා කරන විදුලි පහන් ප්‍රමාණයද සටහන් තබා යුතු බවත්, පසුගිය කාලයේ අකුණු සක්‍රීය වූ විට වීදි පහන් විශාළ ප්‍රමාණයක් පිච්චී ඇති බැවින් විදුලි පහන් සඳහා පියුෂ් එකක් සවි කරීම සුදුසු බවත් එවිට අකුණු වලදී වීදි පහන් පිච්චීම නොවන බවත් ගරු ප්‍රාෙදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා පවසන ලදි.

ප්‍රධාන මාර්ගයේ විදුලි පහන් 39ක් සවි කළ බවත්,ඊට පසු දින විදුලි පහන් 08ක් සවි කර ඇති බවත්,විදුලි පහන් සවි කිරීමට යන පුද්ගලයන්ට පෙර සූදානමක් තිබිය යුතු බවත්,විදුලි පහන් සවි කිරීමට අවශ්‍ය උපකරණ ඔවුන් රැගෙන යා යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා පවසන ලදි.

ගිය මුදල් කමිටුව සඳහා ෆොටෝ කොපි යන්ත්‍රය සකස් කිරීම සඳහා ඇස්තමේන්තුවක් ඉදිරිපත් වූ බවත්,එවැනි ඇස්තමේන්තුවක් එම පුද්ගලයා ඉදිරිපත් නොකළ බවත්,එසේ තත්වයකදී එම නිලධාරියාම විදුලි පහන් සවි කිරීම සඳහා සේවා අවශ්‍යතාවයක් පැන නැගුණ හෙයින් දුරතකතනයෙන් ඇමතු අවස්ථාවේදී සම්බන්ධ නොවූ බවත්,සමහර කාර්යයන් වලට සක්‍රීයව දායකත්වය ලබා දෙන බවත්,සේවක ප්‍රශ්නයක් තිබෙන බවත්,සනීපාරක්ෂක කම්කරුවන් කාර්යාලයේ වැඩ කරන බවත්,නිසි ආකාරයට විෂයන් බෙදීමක් සිදු විය යුතු බවත්,මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කළ යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

බෝපිටිය කොට්ඨාශයට අවශ්‍ය පරිදී වීදි පහන් සවි නොවූ බවත්,විදි ලාම්පු 05ක්වත් වෙසක් වලට කලින් සවි කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා ඉල්ලා සිටින ලදි.

මෙම වීදි පහන් සවි කිරීම සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා කාර්මික හා සේවා කමිටුව මඟින් සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරීමටත්,එම නිර්දේශ ඉදිරි සභාවේදී ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා පවසන ලදි.

කාර්මික හා සේවා කමිටුව සඳහා උප සභාපති තුමා නිර්දේශ කිරීම සුදුසු බවට ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 16</u>**

විදුලි කාර්මිකයින් ,මාර්ග කම්කරුවන් ,සෞඛ්‍ය කම්කරුවන්,රියදුරන්,යන්ත්‍ර ක්‍රියාකරුවන් (JCB) අවශ්‍යතාවය මත සභාවේ සේවා කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා දෛනික කුලී පදනම මත බාහිර පුහුණු හා නුපුහුණු පුද්ගලයන් සේවයේ යොදවා ගැනීම සුදුසු බවත්,වීදි පහන් ගැටළු සම්බන්ධයෙන් කාර්මික සේවා කමිටුව හරහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ සකස් කොට ලබන සභා වාරය සඳහා එම නිර්දේශ ඉදිරිපත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

16.සභාව මඟින් සිදු කරන හෝ කිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රියාත්මක කිරීමේදී කොන්ත්‍රාත්කරුවන් මඟින් සිදු කර ගැනීමට සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 17</u>**

සභාව මඟින් සිදු කරන හෝ කිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රියාත්මක කිරීමේදී කොන්ත්‍රාත්කරුවන් මඟින් සිදු කර ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

17.මන්ත්‍රී සුභ සාධක සංගමයක් පිහිටුවීමට සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 18</u>**

මන්ත්‍රී වරුන්ගේ සුභ සාධනය වෙනුවෙන් මන්ත්‍රී සුභ සාධක සංගමයක් පිහිටුවීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

**<u>II.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමියගේ යෝජනා.</u>**

18. 2026.02.11 වන දින සභා තීරණ අංක 06 යටතේ ලබා ගත් පහත සඳහන් යෝජනාව සංශෝධනය කිරීම

පාතකඩ මහජන පුස්තකාලය අලුත්වැඩියා කිරීමේදී ඉවත් කරන ලද පරණ වහළයේ භාවිතයට ගත හැකි සෙවිළි තහඩු හේන්යාය දොඹගස්වින්න ග්‍රාම නිලධාරී වසමේ පදිංචි පී.එච්.සුරංජි දර්ශනී මහත්මියගේ නිවස වහළ මට්ටමට ඉදි කර ඇති කාමර 02 හා සාලය සඳහා ලබා දීමට 2026.02.11 වන දින සභා තීරණ අංක 06 යටතේ සභා සම්මත කරන ලද යෝජනාව අනුව එම සෙවිළි තහඩු ඇය විසින් ලබා නොගැනීම නිසා වරාගොඩ පාර ,දොඹගස්වින්න,සන්නස්ගම ලිපිනයෙහි දැනට පවත්වාගෙන යන පොඩි කඩයේ බිත්ති ටික බැදීම සඳහා සෙවිළි තහඩු සහ ගඩොල් ටිකද විජේ සුමනපාල යන අයට ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 19</u>**

පාතකඩ මහජන පුස්තකාලය අලුත්වැඩියා කිරීමේදී ඉවත් කරන ලද පරණ වහළයේ භාවිතයට ගත හැකි සෙවිළි තහඩු හා ගඩොල් වරාගොඩ පාර ,දොඹගස්වින්න,සන්නස්ගම ලිපිනයෙහි දැනට පවත්වාගෙන යන පොඩි කඩයේ බිත්ති ටික බැදීම හා වහළය සඳහා සෙවිළි තහඩු සහ ගඩොල් විජේ සුමනපාල යන අයට ලබා දීම සුදුස බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>III. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.සුලාරි සඳරේඛා මැතිතුමියගේ යෝජනා.</u>**

19.ගනේගම වසම තුල අලුතින් සවි කළ විදුලි පහන් අක්‍රියව ඇති බැවින් ඒවා නැවත අලුතින් සවි කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 20</u>**

ඉදිරියේදී ගනේගම වසම සඳහා විදී පහන් සවි කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

20.මහින්ද විද්‍යාලය ඉදිරිපිට ඇති කාණුව වසා ඇති කොටස් කැඩී යාම හේතුවෙන් එය පිළිසකර කිරීමට අදාළ අංශ දැනුවත් කර දෙන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 21</u>**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් විධායක ඉංජිනේරු කාර්යාලය (පළාත් මාර්ග) දැනුවත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

21.පාසල් නිමවන විට විද්‍යාල මාවත මාර්ගයේ ඇති තදබදය ඇතිවන හේතුව කුට්ටපිටිය බස් රථය නිසාය.එම වේලාවට පොලිස් මහතෙකුගේ සේවය ලබා ගැනීමට කටයුතු කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 22**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් පැල්මඩුල්ල පොලිස් ස්ථානය දැනුවත් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**V.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමාගේ යෝජනා.**

23.බැරණ්ඩුව ග්‍රාමීය බැංකුව අසළ ඇති මාර්ගයෙන් ප්‍රධාන මාර්ගයට ගල් කැට,වැලි,පස් ආදිය සේදී යාම වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 23**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

24.ලෙල්ලෝපිටිය හෙට්ටිකන්ද ප්‍රධාන මාර්ගය දෙපස ඇති කාණු පද්ධතිය හා නාම පුවරු නඩත්තු කිරීමට අදාළ ආයතන දැනුවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 24**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් විධායක ඉංජිනේරු කාර්යාලය (පළාත් මාර්ග) දැනුවත් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

මේ දින වල පවතින වර්ෂාව හේතුවෙන් අද උදෑසන බැරණ්ඩුව ප්‍රදේශයේ නිවසකට පස් කන්දක් කඩාවැටී ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය උපකාරයක් සිදු කර දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ සුමේධ ලක්මාල් මැතිතුමා පවසන ලදි.

**හදිසි යෝජනා.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමාගේ යෝජනා.**

සන්නස්ගම මැලිබන් ගාමන්ට් පුද්ගලික කර්මාන්ත ශාලාවට අයත් අපද්‍රව්‍ය බැහැර කරන කාණු පද්ධතිය නිසියාකාරව නඩත්තු නොකිරීම නිසා අසළ පිහිටි ඉඩම් සහ කුඹුරු යාය විනාශ විඇත.තවද අපද්‍රව්‍ය පිරි ජලය කුඹුරු හරහා යන වේල්ලට බැහැර වේ.එම නිසා වේල්ලද අපිරිසිදු වී ඇත.මීට පෙරද කිහිප වතාවක් මේ පිළිබඳ දැනුවත් කර ඇත.එම නිසා මේ පිළිබඳ සොයා බලා කඩිනම් පියවරක් ගන්නා ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අසනීප තත්වයෙන් පසු වූ අවස්ථාවේදී උදව් උපකාර කළ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලුම මන්ත්‍රීවරුන්ට හා ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයට ගෞරවනීය ස්තුතිය පුදකරන අතර, විශේෂයෙන්ම සභාපතිතුමාගේ මනුස්සකම ඉහළින් අගය කරන බවත්, ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී මංජුල දසනායක මැතිතුමාගේ සොහොයුරා වන ගාමිණී දිසානායක මහතාගේ අභාවය වෙනුවෙන් හා මාරපන හකමුව ඉන්දික මන්ත්‍රීතුමාගේ පියාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන බවත්,ඉදිරියේදී සේවකයන් ස්ථිර කිරීමක් රජයෙන් සිදු කරන බවත්,සභාවේ 03දෙනෙකු මහ හැරෙන බවය.මෙයට දින ප්‍රශ්නයක් බලපාන බවත්,දිස්ත්‍රික්කයේම මෙම ප්‍රශ්නය තිබෙන බැවින් ප්‍රාදේශීය සභා වල සේවකයින් ස්ථිර කිරීමේදී මාස ගාණක් බලපාන බැවින් රජයට සභාවක් ලෙස මෙම තුන්දෙනාව ස්ථිර කරන ලෙස යෝජනාවක් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසන ලදි.

**තීරණ අංක 25**

මහජන සෞඛ්‍ය පරීක්ෂක හා කාර්මික නිලධාරී හරහා වාර්තාවක් ලබා ගැනීමටත්,ඒ අනුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

**07.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

2026.04.27 පැවති කාර්මික හා සේවා කමිටු රැස්වීම් වාර්තාව හා 2026.04.28 පුස්තකාල උපදේශක කමිටු වාර්තාව සභාගත කරන ලදි.

මත්ද්‍රව්‍ය නිවාරණ වැඩ සටහන සඳහා පාසල් 03ක් යෝජනා කර ඇති බවත්,පාතකඩ බෞද්ධ විද්‍යාලයේ වැඩසටහන් 2026.06.02 දිනය සංශෝධනය විය යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා පවසන ලදි.

PD 7614 කැබ් රථයේ AC හැදීම ඇදි ඇදී යන බැවින් AC ඉක්මනින් සවි කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසන ලදි.

මෙම කැබ් රථයේ AC හැදීම සම්බන්ධයෙන් දෙවන කාර්මික කමිටුවට යෝජනාවක් ආ බවත්,එම අවස්ථාවේදී නිසි තොරතුරු නොලැබුණ බැවින් නිර්දේශ ලබා දීමට නොහැකි බවත්,නිසි ආකාරයට යෝජනාව ඉදිරිපත් කරන ලෙස නිලධාරීන් දැනුවත් කළ බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා පවසන ලදි.

සියලු කමිටු වලට පක්ෂ විපක්ෂ මන්ත්‍රී වරුන් එම අවස්ථාවලට සම්බන්ධ වන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා ඉල්ලා සිටින ලදි.

2025.04.30 වන දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභාගත කරන ලදි.

ඒ අනුව අංක 14 දරණ මාළු කඩ කාමරය ටෙන්ඩරය සම්බන්ධයෙන් වැඩිම මිලක් අම්බලන්දෙණිය,නිවිතිගල ලිපිනයේ ජී.ඩී.එම්.පී.කරුණාරත්න (රු,2,650,000.00)ඉදිරිපත් කර ඇති බවත්,ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

**08.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළයුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.**

2026.03.01 සිට 2026.03.31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව සභා ගත කරන ලදි.

**වෙනත් කරුණු**

- **සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්**.
- **<u>සභාපතිතුමාගේ ස්තුති කිරීම.</u>**

අද දින සභාවට පැමිණ සිටින ගරු උප සභාපතිතුමන් ,විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

- ප.ව.1.10 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

  ගරු ප්‍රාදේශීය සභා ..................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ........................................................................ මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2026-06-10 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව